රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:22/90

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1990 මාර්තු මස 30 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,
සහ දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

**විනයානුකූල කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන්**
**සභාව සමග ලිපි ගණුදෙනු කිරීම.**

1990.02.14 දින සිට බලපවත්වන පරිදි ආයතන සංග්‍රහයේ දෙවන කොටසේ xiviii පරිච්ඡේදයේ 8:1:1 සහ 8:2 වගන්ති පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

"**8:1:1.** කොමිෂන් සභාව වෙත හෝ" එහි කමිටුවක් වෙත යැවෙන වැදගත් සෑම ලියුමක්ම, අමාත්‍යාංශයකින් නම් එහි ලේකම්වරුයා විසින්ද, දෙපාර්තමේන්තුවකින් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින්ද. අත්සන් කළයුතුය. කෙසේ" වෙතත් රාජ්‍ය අමාත්‍යවරයකුගේ ලේකම්වරයකු පත්කර ඇති අවස්ථාවක ලේකම්වරයා වෙනුවට එවැනි ලියවිලි වලට අත්සන් තැබීමට එවැනි රාජ්‍ය අමාත්‍යවරයකුගේ ලේකම්වරයාට බලය දීමට ලේකම්වරයාට පුළුවන. මුදල් අමාත්‍යාංශය සම්බන්ධයෙන් වනවිට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ලේකම්වරයා වෙනුවෙන් එවැනි ලියවිලි අත්සන් කිරීමට බලය දීමට ලේකම්වරයාට පුළුවන."

"**8:2.** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ එකී කමිටුවක හෝ රැස්වීමකට පැමිණෙන ලෙස ලේකම්වරයකුට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයකුට ආරාධනා ලැබුණු විට, හැකි සෑම අවස්ථාවකම පෞද්ගලිකවම සහභාගී විය යුතුය. කෙසේ වෙතත් රාජ්‍ය අමාත්‍යවරයකුගේ ලේකම්වරයකු පත්කර ඇති අවස්ථාවක ලේකම්වරයා වෙනුවට රැස්වීම්වලට සහභාගීවීමට එවැනි රාජ්‍ය අමාත්‍යවරයකුගේ ලේකම්වරයාට බලය දීමට ලේකම්වරයාට පුළුවන. මුදල් අමාත්‍යාංශය සම්බන්ධයෙන් වනවිට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ලේකම්වරයා වෙනුවෙන් එවැනි රැස්වීම්වලට සහභාගීවීමට බලය දීමට ලේකම්වරයාට පුළුවන.

අ.කලේ/(පී.එන්.එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.